ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

කළමනාකරණ අධ්‍යයනවේදී උපාධි වැඩ සටහන

5 වන මට්ටම අවසාන පරීක්ෂණය 2008

**MCU 3209 - කළමනාකරණය සඳහා ප්‍රමාණාත්මක විධි -II**

කාලය - පැය 03 යි.

---

දිනය - 2008 පෙබරවාරි 09 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30

---

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.
සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ඇත.
වැඩ සටහන් සම්පාදනය කල නොහැකි ගණක යන්ත්‍ර භාවිතා කල හැක.

01. (අ) ප්‍රමථ ව්‍යාප්තියක මූලික ලක්ෂණ පැහැදිළි කරන්න. සංඛ්‍යාත විශ්ලේෂණයේදී ප්‍රමථ ව්‍යාප්තියේ වැදගත්කම කෙටියෙන් පැහැදිළි කරන්න.

(ආ) කම්හලක සේවකයන් 2000 ක් සිටිති. සේවකයන්ගේ වැටුප්වල සමාන්තර මධ්‍යන්‍යය රු. 20,000/- සහ සම්මත අපගමනය රු. 2,000/- ක් වේ. සේවක වැටුප් ප්‍රමථ ලෙස ව්‍යාප්තවී ඇතැයි උපකල්පනය කරමින් පහත ඒවා ගණනය කරන්න.

**(i)** රු. 20,000/- ට අඩු වැටුපක් ලබන සේවකයන්ගේ ප්‍රතිශතය

**(ii)** රු. 17,500/- සහ රු. 25,000/- අතර වැටුපක් ලබන සේවක සංඛ්‍යාව

**(iii)** ඉහලම වැටුප් ලබන සේවකයන්ගේ 10% හි වැටුප් මට්ටම

02. (අ) විවික්ත සම්භාවිතා ව්‍යාප්තියක් යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි විස්තර කරන්න.

(ආ) $\mathbf{n = 5,\ r = 3}$ සහ $\mathbf{p = 0.6}$ විටදී $"C_r p^r q^{n-r}$ විස්තර කර අගයන්න.

(ඇ) එක්තරා පොලිතීන් බෑගයකට කි.ග්‍රෑ. 5 ක් දරා ගැනීමට ඇති හැකියාවේ සම්භාවිතාව 70% කි. එම පොලිතීන් බෑග් 6 කින් 4 කට වඩා කි.ග්‍රෑ. 5 ක් දරා ගැනීමට ඇති හැකියාවේ සම්භාවිතාව කීය ද?

(ඈ) ඉහත (ඇ) හි සඳහන් කල පොලිතීන් බෑග 100 ක මිටියකින් 80% කට කි.ග්‍රෑ. 5 ක් දරා සිටීමට සාර්ථක වීමට ඇති සම්භාවිතාව කීය ද?

03. (අ) මීළඟ පැයේදී ගනුදෙනුකරුවන් 4 දෙනෙකු එක්තරා දුරකථනයක් භාවිතා කිරීමේ සම්භාවිතාව $e^{-5}5^4/4!$ ලෙස දක්වා ඇත. මෙම ප්‍රකාශය පැහැදිලි කර සම්භාවිතාව අගයන්න. **(e =2.718)**

(ආ) රාත්‍රී කාලයේදී රැගෙන ගොස් පරිශීලනය කිරීම පිණිස බැහැර දෙන සංඛ්‍යානය පොත් දෙකක් පුස්තකාලය සතුය. මේ පොතක් සඳහා ඉල්ලුමේ මධ්‍යන්‍යය 1.5 ක් වන පොයිසොන් ව්‍යාප්තියක පිහිටන බව පෙනී ගොස් ඇත.

(i) දී ඇති දිනකදී පොත් දෙකම තිබීමේ සම්භාවිතාව ගණනය කරන්න.

(ii) ඉල්ලුම ප්‍රතික්ෂේපවීමට ඇති සම්භාවිතාව කීය ද?

(iii) යම් සිසුන් පිරිසකට දින 5 කාලයකදී පොත බැහැරගෙන යාමට නොහැකිවීමේ සම්භාවිතාව කීය ද?

(ඇ) නිෂ්පාදනායතනයක කමිස 100 ක් ඒවායේ දෝෂ පිළිබඳව පරීක්ෂා කර පහත දත්ත දී ඇත.

| දෝෂ සංඛ්‍යාව | 0 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|
| කමිස ගණන | 84 | 8 | 4 | 3 | 1 |

(i) ඉහත දත්ත පොයිසෝන් ව්‍යාප්තියකට සම්බන්ධ කරන්න.

(ii) දී ඇති කමිසයක දෝෂ 3 කට වැඩිවීමේ සම්භාවිතාව කුමක් ද?

04. (අ) කාල ශ්‍රේණි දත්තවල අංග සුදුසු උදාහරණ සමඟ පැහැදිලි කරන්න.

(ආ) නිෂ්පාදන ආයතනයක පසුගිය වසර 5 ක එක් එක් කාර්තුවේ විකුණුම්වල හා එහි මධ්‍ය චල මධ්‍යන්‍ය විකුණුම් වල ප්‍රතිශතය පහත දී ඇත.

| වසර | I | II | III | IV |
|---|---|---|---|---|
| 2003 | - | - | 96 | 112 |
| 2004 | 103 | 94 | 99 | 114 |
| 2005 | 102 | 95 | 98 | 110 |
| 2006 | 104 | 96 | 100 | 112 |
| 2007 | 106 | 96 | | |

(i) එක් එක් කාර්තුවල ඍතුමය සංගුණක ගණනය කරන්න.

(ii) 2008 වසර සඳහා පුරෝකථනය ඒකක 10,000 ක් නම් එක් එක් කාර්තුව සඳහා විකුණුම් ඇස්තමේන්තු කරන්න.

05. (අ) නියැදි සමීක්ෂණ සහ සංගහන සමීක්ෂණ අතර වෙනස පැහැදිලි කරන්න. මෙම දත්ත එකතු කිරීමේ ක්‍රම යොදා ගැනීමට අදාල වන කොන්දේසි සාකච්ඡා කරන්න. මෙසේ දත්ත එකතු කිරීමේ දී මුහුණදීමට සිදුවිය හැකි විවිධාකාර වැරදීම් මොනවා ද?

(ආ) සුසංහිත ප්‍රතිදීප්ත බල්බ (CFL) නිෂ්පාදකයෙකු ඔහුගේ බල්බවල මධ්‍යන්‍ය ආයුකාලය වසර 3 ක් බවත් එහි සම්මත අපගමනය වසර 0.5 ක් බවත් ප්‍රකාශ කරයි. සසම්භාවී ලෙස තෝරාගත් බල්බ 100 ක නියැදියක මධ්‍යන්‍ය ආයු කාලය වසර 3.2 ක් බව දක්නට ලැබුණි. 5% වෙසෙසියා මට්ටමේදී, ඔබ නිෂ්පාදකගේ ප්‍රකාශය සමග එකඟ වන්නේ ද?

(ඇ) කම්හල් දෙකක නිෂ්පාදිත සසම්භාවී ලෙස තෝරාගත් විදුලි පහන් 100 බැගින් වූ නියැදි දෙකක ඒවායේ ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීමේදී ලැබූ දත්ත පහත දැක්වේ.

| | මධ්‍යන්‍ය ජීව කාලය (පැය) | සම්මත අපගමනය (පැය) |
|---|---|---|
| A කම්හල | 11,000 | 100 |
| B කම්හල | 10,500 | 90 |

කම්හල් දෙකේ නිෂ්පාදිත විදුලි පහන්වල මධ්‍යන්‍ය ජීව කාලය අතර සැලකිය යුතු වෙනසක් දක්නට ලැබේ ද? (5% වෙසෙසියා මට්ටමේදී)

06. (අ) ව්‍යාපාර සඳහා "කයි වර්ග" පරීක්ෂාවක ඇති වැදගත්කම සාකච්ඡා කරන්න. මෙම පරීක්ෂාව සම්බන්ධ පරීක්ෂාව **(test of association)** සඳහා යොදා ගන්නේ කෙසේදැයි පැහැදිළි කරන්න.

(ආ) බැංකුවක පුහුණු කිරීම් කළමනාකරු ඔහුගේ පුහුණු වැඩසටහන්වල ඵලදායීතාවය පරීක්ෂා කිරීමට අදහස් කරයි. ඔහු පහත දත්ත රැස්කර ගෙන ඇත. ඔහුට සහාය වන්න. (5% වෙසෙසියා මට්ටම යොදා ගන්න.)


| ක්‍රියාකාරිත්වය | පුහුණුවේ මට්ටම | | | එකතුව |
|---|---|---|---|---|
| | බලවත් | මැදිහත් | නාමික | |
| සාමාන්‍යයට වඩා වැඩි | 100 | 150 | 50 | 300 |
| සාමාන්‍ය | 100 | 100 | 100 | 300 |
| දුර්වල | 50 | 100 | 150 | 300 |

07. පහත සඳහන් දෑ අතුරින් ඕනෑම 04 ක් සඳහා කෙටි සටහන් ලියන්න.

(අ) නියැදි දෝෂ සහ නියැදි නොවන දෝෂ
(ආ) ද්විපද සහ පොයිසෝන් ව්‍යාප්ති ප්‍රමථ ව්‍යාප්තිවලට ආසන්න කිරීම
(ඇ) **II** වර්ගයේ වරද සහ පරීක්ෂාවේ බලය
(ඈ) **Null Hypothesis** සහ **Alternative hypothesis.**
(ඉ) **One tail test** සහ **two tail tests.**

- හිමිකම් ඇවිරිණි. -

**Standard normal distribution**




| z | .00 | .01 | .02 | .03 | .04 | .05 | .06 | .07 | .08 | .09 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 0.0 | .500000 | .503989 | .507978 | .511966 | .515953 | .519939 | .523922 | .527903 | .531881 | .535856 |
| 0.1 | .539828 | .543795 | .547758 | .551717 | .555670 | .559618 | .563559 | .567495 | .571424 | .575345 |
| 0.2 | .579260 | .583166 | .587064 | .590954 | .594835 | .598706 | .602568 | .606420 | .610261 | .614092 |
| 0.3 | .617911 | .621720 | .625516 | .629300 | .633072 | .636831 | .640576 | .644309 | .648027 | .651732 |
| 0.4 | .655422 | .659097 | .662757 | .666402 | .670031 | .673645 | .677242 | .680822 | .684386 | .687933 |
| 0.5 | .691462 | .694974 | .698468 | .701944 | .705401 | .708840 | .712260 | .715661 | .719043 | .722405 |
| 0.6 | .725747 | .729069 | .732371 | .735653 | .738914 | .742154 | .745373 | .748571 | .751748 | .754903 |
| 0.7 | .758036 | .761148 | .764238 | .767305 | .770350 | .773373 | .776373 | .779350 | .782305 | .785236 |
| 0.8 | .788145 | .791030 | .793892 | .796731 | .799546 | .802337 | .805105 | .807850 | .810570 | .813267 |
| 0.9 | .815940 | .818589 | .821214 | .823814 | .826391 | .828944 | .831472 | .833977 | .836457 | .838913 |
| 1.0 | .841345 | .843752 | .846136 | .848495 | .850830 | .853141 | .855428 | .857690 | .859929 | .862143 |
| 1.1 | .864334 | .866500 | .868643 | .870762 | .872857 | .874928 | .876976 | .879000 | .881000 | .882977 |
| 1.2 | .884930 | .886861 | .888768 | .890651 | .892512 | .894350 | .896165 | .897958 | .899727 | .901475 |
| 1.3 | .903200 | .904902 | .906582 | .908241 | .909877 | .911492 | .913085 | .914657 | .916207 | .917736 |
| 1.4 | .919243 | .920730 | .922196 | .923641 | .925066 | .926471 | .927855 | .929219 | .930563 | .931888 |
| 1.5 | .933193 | .934478 | .935745 | .936992 | .938220 | .939429 | .940620 | .941792 | .942947 | .944083 |
| 1.6 | .945201 | .946301 | .947384 | .948449 | .949497 | .950529 | .951543 | .952540 | .953521 | .954486 |
| 1.7 | .955435 | .956367 | .957284 | .958185 | .959070 | .959941 | .960796 | .961636 | .962462 | .963273 |
| 1.8 | .964070 | .964852 | .965620 | .966375 | .967116 | .967843 | .968557 | .969258 | .969946 | .970621 |
| 1.9 | .971283 | .971933 | .972571 | .973197 | .973810 | .974412 | .975002 | .975581 | .976148 | .976705 |
| 2.0 | .977250 | .977784 | .978308 | .978822 | .979325 | .979818 | .980301 | .980774 | .981237 | .981691 |
| 2.1 | .982136 | .982571 | .982997 | .983414 | .983823 | .984222 | .984614 | .984997 | .985371 | .985738 |
| 2.2 | .986097 | .986447 | .986791 | .987126 | .987455 | .987776 | .988089 | .988396 | .988696 | .988989 |
| 2.3 | .989276 | .989556 | .989830 | .990097 | .990358 | .990613 | .990863 | .991106 | .991344 | .991576 |
| 2.4 | .991802 | .992024 | .992240 | .992451 | .992656 | .992857 | .993053 | .993244 | .993431 | .993613 |
| 2.5 | .993790 | .993963 | .994132 | .994297 | .994457 | .994614 | .994766 | .994915 | .995060 | .995201 |
| 2.6 | .995339 | .995473 | .995604 | .995731 | .995855 | .995975 | .996093 | .996207 | .996319 | .996427 |
| 2.7 | .996533 | .996636 | .996736 | .996833 | .996928 | .997020 | .997110 | .997197 | .997282 | .997365 |
| 2.8 | .997445 | .997523 | .997599 | .997673 | .997744 | .997814 | .997882 | .997948 | .998012 | .998074 |
| 2.9 | .998134 | .998193 | .998250 | .998305 | .998359 | .998411 | .998462 | .998511 | .998559 | .998605 |


Some useful formula (in familiar notation)

$$r = \frac{\sum xy - \frac{\sum x \sum y}{n}}{\sqrt{\left(\sum x^2 - \frac{\left(\sum x\right)^2}{n}\right)\left(\sum y^2 - \frac{\left(\sum y\right)^2}{n}\right)}}$$

$$b = \frac{n\sum xy - \sum x \sum y}{n\sum x^2 - \left(\sum x\right)^2}, \qquad a = \bar{y} - b\bar{x}$$

$$\chi^2 = \sum \frac{(O-E)^2}{E}$$

Chi-Squre Table:
Values of $\chi^2_\alpha$




| $\chi^2_{.10}$ | $\chi^2_{.05}$ | $\chi^2_{.025}$ | $\chi^2_{.01}$ | $\chi^2_{.005}$ | df |
|---|---|---|---|---|---|
| 2.70554 | 3.84146 | 5.02389 | 6.63490 | 7.87944 | 1 |
| 4.60517 | 5.99147 | 7.37776 | 9.21034 | 10.5966 | 2 |
| 6.25139 | 7.81473 | 9.34840 | 11.3449 | 12.8381 | 3 |
| 7.77944 | 9.48773 | 11.1433 | 13.2767 | 14.8602 | 4 |
| 9.23635 | 11.0705 | 12.8325 | 15.0863 | 16.7496 | 5 |
| 10.6446 | 12.5916 | 14.4494 | 16.8119 | 18.5476 | 6 |
| 12.0170 | 14.0671 | 16.0128 | 18.4753 | 20.2777 | 7 |
| 13.3616 | 15.5073 | 17.5346 | 20.0902 | 21.9550 | 8 |
| 14.6837 | 16.9190 | 19.0228 | 21.6660 | 23.5893 | 9 |
| 15.9871 | 18.3070 | 20.4831 | 23.2093 | 25.1882 | 10 |
| 17.2750 | 19.6751 | 21.9200 | 24.7250 | 26.7569 | 11 |
| 18.5494 | 21.0261 | 23.3367 | 26.2170 | 28.2995 | 12 |
| 19.8119 | 22.3621 | 24.7356 | 27.6883 | 29.8194 | 13 |
| 21.0642 | 23.6848 | 26.1190 | 29.1413 | 31.3193 | 14 |
| 22.3072 | 24.9958 | 27.4884 | 30.5779 | 32.8013 | 15 |
| 23.5418 | 26.2962 | 28.8454 | 31.9999 | 34.2672 | 16 |
| 24.7690 | 27.5871 | 30.1910 | 33.4087 | 35.7185 | 17 |
| 25.9894 | 28.8693 | 31.5264 | 34.8053 | 37.1564 | 18 |
| 27.2036 | 30.1435 | 32.8523 | 36.1908 | 38.5822 | 19 |
| 28.4120 | 31.4104 | 34.1696 | 37.5662 | 39.9968 | 20 |
| 29.6151 | 32.6705 | 35.4789 | 38.9321 | 41.4010 | 21 |
| 30.8133 | 33.9244 | 36.7807 | 40.2894 | 42.7956 | 22 |
| 32.0069 | 35.1725 | 38.0757 | 41.6384 | 44.1813 | 23 |
| 33.1963 | 36.4151 | 39.3641 | 42.9798 | 45.5585 | 24 |
| 34.3816 | 37.6525 | 40.6465 | 44.3141 | 46.9278 | 25 |
| 35.5631 | 38.8852 | 41.9232 | 45.6417 | 48.2899 | 26 |
| 36.7412 | 40.1133 | 43.1944 | 46.9630 | 49.6449 | 27 |
| 37.9159 | 41.3372 | 44.4607 | 48.2782 | 50.9933 | 28 |
| 39.0875 | 42.5569 | 45.7222 | 49.5879 | 52.3356 | 29 |
| 40.2560 | 43.7729 | 46.9792 | 50.8922 | 53.6720 | 30 |
| 51.8050 | 55.7585 | 59.3417 | 63.6907 | 66.7659 | 40 |
| 63.1671 | 67.5048 | 71.4202 | 76.1539 | 79.4900 | 50 |
| 74.3970 | 79.0819 | 83.2976 | 88.3794 | 91.9517 | 60 |
| 85.5271 | 90.5312 | 95.0231 | 100.425 | 104.215 | 70 |
| 96.5782 | 101.879 | 106.629 | 112.329 | 116.321 | 80 |
| 107.565 | 113.145 | 118.136 | 124.116 | 128.299 | 90 |
| 118.498 | 124.342 | 129.561 | 135.807 | 140.169 | 100 |